සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA2 විභාගය - 2016 ජනවාරි

## (AA21) උසස් මූල්‍ය ගිණුම්කරණය

(Advanced Financial Accounting)

2016-01-30
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 12
ප්‍රශ්න ගණන: 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්යය ප්‍රශ්න හය (06) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.6 දක්වා ප්‍රශ්න සඳහා උත්තර අදාල ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 ලාභ අරමුණු කර නොගත් සංවිධානයක් වන ක්‍රීඩා සමාජයක පොත් වලින්, 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ, පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදී:

(a) සාමාජිකත්වය සඳහා වාර්ෂික සාමාජික දායක මුදල රු.9,000/- ක් වේ.

(b) 2014 අප්‍රේල් 01 දිනට, හිඟ සාමාජික දායක මුදල් රු.81,000/- ක් වූ අතර, ඉදිරියට ගෙවනු ලැබූ සාමාජික දායක මුදල් රු.45,000/- ක් විය.

(c) සාමාජිකයන් 50 දෙනෙකු ප්‍රවර්තන වර්ෂය සඳහා සාමාජික දායක මුදල් ගෙවූ අතර, ඔවුන් අතුරෙන් සාමාජිකයන් 8 දෙනෙකු පසුගිය වර්ෂයේ හිඟ සාමාජික දායක මුදල් ද ගෙවා තිබුණි.

(d) සාමාජිකයන් 7 දෙනෙකු ඊළඟ වර්ෂය සඳහා සාමාජික දායක මුදල් ද ගෙවා තිබුණේය.

(e) එහි වාර්තා අනුව, 2015 මාර්තු 31 දිනට, ක්‍රීඩා සමාජයේ සාමාජිකයෝ 60 දෙනෙක් සිටියහ. සාමාජිකයෙකු ක්‍රීඩා සමාජයට බැඳෙන වර්ෂයේ ගෙවන දායක මුදල සම්පූර්ණ වර්ෂය සඳහා ආදායමක් ලෙස හඳුනා ගනු ලැබේ.

2015 මාර්තු 31 දිනට සාමාජික දායක මුදල් ගිණුම පිළියෙල කරන්න. (ලකුණු 03)

**1.2** එකතුකළ අගය මත බදු (Value Added Tax - VAT) සඳහා ලියාපදිංචි සැපයුම්කරුවෙකු වන **සීමාසහිත ඩෝ වූ ඩෝ (පෞද්ගලික) සමාගම, දේශීයව පණිවුඩ සේවා** (local courier service) සපයන්නෙකු වන අතර පහත තොරතුරු 2015 සැප්තැම්බර් මාසය සඳහා එහි පොත්වලින් උපුටා ගන්නා ලදී:

| | **රු.** |
|---|---|
| එකතුකළ අගය මත බදු (VAT) වලට යටත් පණිවුඩ සේවා සැපයුම් | 18,463,000 |
| වලංගු එකතුකළ අගය මත බදු (VAT) ඉන්වොයිසි මගින් සනාථ කළ හැකි මිලදී ගැනුම් | 6,382,000 |
| එකතුකළ අගය මත බදු (VAT) ඉන්වොයිසි මගින් සනාථ කළ හැකි එකතුකළ අගය මත බදු (VAT) වලට යටත් අනෙකුත් වියදම් | 1,312,000 |

එකතුකළ අගය මත බදු (VAT) අනුපාතිකය 12% ක් යැයි උපකල්පනය කරන්න.

2015 සැප්තැම්බර් 30 දිනට එකතුකළ අගය මත බදු (VAT) පාලන ගිණුම පිළියෙල කරන්න. (ලකුණු 03)

**1.3** වගකීම් සීමිත පොදු සමාගමකට අදාලව පහත දෑ සම්බන්ධයෙන් 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන සඳහන් කරන්න:

(a) අවම අධ්‍යක්ෂවරුන්ගේ ගණන.

(b) මහජනතාවට සාමාන්‍ය කොටස් නිකුත් කිරීම. (ලකුණු 04)

**1.4** පහත දෑ සම්බන්ධයෙන්, 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ විධිවිධාන සඳහන් කරන්න:

(a) ප්‍රාග්ධන පොලිය.

(b) හවුල්කරුවන්ගේ වැටුප් (remuneration). (ලකුණු 04)

**1.5** ණය සාධන පත්‍රයක් (debt instrument) ස්කන්ධ සාධන පත්‍රයක් (equity instrument) සමග සැසඳීමේදී ඇති ප්‍රධාන වෙනස්කම් දෙකක්(02) සඳහන් කරන්න. (ලකුණු 04)

**1.6** LKAS 02 - තොග ප්‍රමිතය ප්‍රකාර නිර්දේශිත පිරිවැය සූත්‍ර දෙක(02) සඳහන් කරන්න. (ලකුණු 02)

*A කොටසෙහි අවසානය*

## <u>B කොටස</u>

අනිවාර්යය ප්‍රශ්න පහ (05) කි.

(මුළු ලකුණු 25)

### 02 වන ප්‍රශ්නය

**අමින්ද ෆැෂන්ස්** හි පොදු ලෙජරයේ ඇතුලත් වෙළෙඳ ගෙවිය යුතු පාලන ගිණුමේ, 2015 ජූලි 31 දිනට, රු.118,300/- ක බැර ශේෂයක් පෙන්නුම් කළ අතර, ගෙවිය යුතු උප ලෙජරයේ පෞද්ගලික ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.118,800/- ක් විය. පසුව පරීක්ෂා කිරීමේදී වෙනසට හේතු වූ පහත සඳහන් කරුණු අනාවරණය විය.

(1) 2015 ජූලි මාසය සඳහා ලද වට්ටම්හි එකතුව වූ රු.11,700/- ක් පාලන ගිණුමේ නිවැරදිව සටහන් කර තිබුණ ද, එය ගෙවිය යුතු පෞද්ගලික ලෙජර් ගිණුම්වල සටහන් වී නොතිබුණි.

(2) ගෙවිය යුතු උප ලෙජරයේ පෞද්ගලික ගිණුම් ශේෂ ලැයිස්තුවේ එකතුව රු.7,000/- ක් වැඩියෙන් (overcasted) සටහන් වී ඇත.

(3) 2015 ජුලි මාසයේ දෛනික මිලදී ගැනුම් පොතේ එකතුව රු.20,000/- කින් වැඩියෙන් සටහන් වී තිබුණි.

(4) 2015 ජුලි මාසය තුළ, සැපයුම්කරුවෙකු වූ **සුපර් ෆැෂන්ස්** වෙත ගෙවිය යුතුව තිබූ රු.2,700/- ක්, ඔවුන්ගෙන් ලැබිය යුතුව තිබූ මුදලට හිලව් කරන ලදී. මෙය අදාල පෞද්ගලික ලෙජර් ගිණුම්වල නිවැරදිව සටහන් කර තිබූ නමුත්, පොදු ලෙජරයේ අදාල පාලන ගිණුම් වලින් අතහැරී තිබුණි.

(5) සැපයුම්කරුවෙකු වෙත මුදලින් ගෙවූ රු.4,500/- ක් පාලන ගිණුමේ නිවැරදි ලෙස සටහන් කර තිබුණ ද, සැපයුම්කරුගේ පෞද්ගලික ලෙජර් ගිණුමේ සටහන් කර තිබුණේ නැත.

**ඔබ විසින් කළ යුතු දෑ,**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) පොදු ලෙජරයේ සංශෝධිත (ගලපන ලද) වෙළෙඳ ගෙවිය යුතු පාලන ගිණුම.

(b) වෙළෙඳ ගෙවිය යුතු පාලන ගිණුමේ සංශෝධිත ශේෂය, ගෙවිය යුතු උප ලෙජරයේ පෞද්ගලික ගිණුම් ශේෂ ලැයිස්තුවේ එකතුව සමඟ සැසඳීමේ ප්‍රකාශනය. (ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සීමාසහිත හයිෆයි (පෞද්ගලික) සමාගමේ** 2015 සැප්තැම්බර් මාසය සඳහා මුදල් පොතේ බැංකු තීරුව, බැංකු ප්‍රකාශනය සහ 2015 අගෝස්තු 31 දිනට පිළියෙල කරන ලද බැංකු ප්‍රකාශනය පහත සඳහන් පරිදි වේ:

**සීමාසහිත හයිෆයි (පෞද්ගලික) සමාගම**

**2015 සැප්තැම්බර් මාසය සඳහා මුදල් පොත (බැංකු තීරුව)**

| දිනය | විස්තරය | | හර (රු.) | බැර (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|---|---|
| 2015.09.01 | ශේෂය | | - | - | (375,050) |
| 2015.09.02 | මුදල් තැන්පතු | | 425,500 | | 50,450 |
| 2015.09.05 | ණයහිමි ගෙවීම | 750131 | | 38,000 | 12,450 |
| 2015.09.10 | එකතු කළ අගය මත බදු (VAT) ගෙවීම | 750132 | | 125,200 | (112,750) |
| 2015.09.12 | ණයහිමි ගෙවීම | 750133 | | 73,350 | (186,100) |
| 2015.09.15 | කුලී ගෙවීම | 750134 | | 50,700 | (236,800) |
| 2015.09.15 | මුදල් තැන්පතු | | 120,000 | | (116,800) |
| 2015.09.18 | ණයගැති තැන්පතු | | 123,000 | | 6,200 |
| 2015.09.18 | මුදල් තැන්පතු | | 254,000 | | 260,200 |
| 2015.09.21 | නඩත්තු ගෙවීම | 750135 | | 12,000 | 248,200 |
| 2015.09.21 | ණයහිමි ගෙවීම | 750136 | | 83,000 | 165,200 |
| 2015.09.25 | වැටුප් (කෙළින්ම මාරු කිරීම) | | | 223,000 | (57,800) |
| 2015.09.30 | චෙක්පත තැන්පතු | 123156 | 50,000 | | (7,800) |
| 2015.09.30 | ශේෂය | | - | - | (7,800) |

**සීමාසහිත හයිෆයි (පෞද්ගලික) සමාගම**

**2015 සැප්තැම්බර් මාසය සඳහා බැංකු ප්‍රකාශනය**

| දිනය | විස්තරය | | හර (රු.) | බැර (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|---|---|
| 2015.09.01 | ශේෂය | | - | - | (172,550) |
| 2015.09.01 | චෙක්පත් තැන්පතු | 148350 | - | 50,000 | (122,550) |
| 2015.09.01 | චෙක්පතින් ගෙවීම් | 750128 | 125,000 | | (247,550) |
| 2015.09.02 | මුදල් තැන්පතු | | | 425,500 | 177,950 |
| 2015.09.11 | චෙක්පතින් ගෙවීම | 750132 | 125,200 | | 52,750 |
| 2015.09.15 | මුදල් තැන්පතු | | | 120,000 | 172,750 |
| 2015.09.18 | සෘජු තැන්පතු | යොමු අංක 12465974 | | 123,000 | 295,750 |
| 2015.09.18 | මුදල් තැන්පතු | | | 254,000 | 549,750 |
| 2015.09.22 | චෙක්පතින් ගෙවීම | 750135 | 12,000 | | 537,750 |
| 2015.09.23 | සෘජු තැන්පතු | යොමු අංක 26487582 | | 93,000 | 630,750 |
| 2015.09.23 | චෙක්පතින් ගෙවීම | 750131 | 38,000 | | 592,750 |
| 2015.09.25 | මාරු කිරීම | යොමු අංක 32648751 | 223,000 | | 369,750 |
| 2015.09.30 | ස්ථාවර නියෝග | ණය අංක 62587413 | 57,000 | | 312,750 |
| 2015.09.30 | බැංකු අයිරා පොලිය හා ගාස්තු | | 2,500 | | 310,250 |
| 2015.09.30 | චෙක්පතින් ගෙවීම | 750133 | 73,350 | | 236,900 |
| 2015.09.30 | චෙක්පතින් ගෙවීම | 750134 | 50,700 | | 186,200 |
| 2015.09.30 | ශේෂය | | | | 186,200 |

**සීමාසහිත හයිෆයි (පෞද්ගලික) සමාගම**

**2015 අගෝස්තු 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය**

| | රු. | රු. |
|---|---|---|
| 2015.08.31 දිනට මුදල් පොත අනුව ශේෂය [ගලපන ලද] (අයිරාව) | | (375,050) |
| **එකතු කළා:** ඉදිරිපත් නොකළ චෙක්පත්: | | |
| 750120 | 127,500 | |
| 750128 | 125,000 | 252,500 |
| **අඩු කළා:** උපලබ්ධි නොවූ තැන්පතු: | | |
| 148350 | | (50,000) |
| **2015.08.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය (අයිරාව)** | | **(172,550)** |

**ඔබ විසින් කළ යුතු දෑ,**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2015 සැප්තැම්බර් මාසය සඳහා ගලපන ලද මුදල් පොත.

(b) 2015 සැප්තැම්බර් 30 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය. (ලකුණු 05)

## **04** වන ප්‍රශ්නය

**සීමාසහිත හිරුන් (පෞද්ගලික) සමාගමේ** 2015 දෙසැම්බර් මාසය සඳහා වැටුප් ලේඛනයේ (payroll) සාරාංශය පහත දී ඇත:

| | රු. |
|---|---|
| දළ වැටුප | 7,570,000 |
| **අඩු කිරීම්:** | |
| සේවක අර්ථසාධක අරමුදල (EPF) 8% | (605,600) |
| **ශුද්ධ වැටුප** | **6,964,400** |

සමාගම විසින් සේවක අර්ථසාධක අරමුදලට (EPF) 12% බැගින් ද සේවක භාර අරමුදලට (ETF) 3% බැගින් ද දායක වනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ,**

මුදල් සම්බන්ධිත සටහන් ද ඇතුළුව, **සීමාසහිත හිරුන් (පෞද්ගලික) සමාගමේ** වැටුප්, සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගෙවීම් සහ සේවක භාර අරමුදල් (ETF) ගෙවීම් සටහන් කිරීම සඳහා ජර්නල් සටහන් **පිළියෙල කරන්න**.

(ලකුණු 05)

## **05** වන ප්‍රශ්නය

**විරාජ්, රංග** සහ **ඉන්දික** ලාභ සහ අලාභ සමසේ බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක නියැලී සිටියහ. 2015 මාර්තු 31 දින **ඉන්දික** හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කරන ලදී.

(1) 2015 මාර්තු 31 දිනට හවුල් ව්‍යාපාරයේ පොත් වලින් පහත ශේෂ උපුටා ගන්නා ලදී:

| **දේපළ, පිරියත හා උපකරණ:** | **පිරිවැය (රු.)** | **සමුච්චිත ක්ෂය (රු.)** |
|---|---|---|
| ඉඩම | 2,300,000 | - |
| ගොඩනැගිලි | 1,575,000 | 393,000 |
| මෝටර් වාහනය | 2,500,000 | 1,000,000 |

| **ශේෂ:** | **විරාජ්** | **රංග** | **ඉන්දික** |
|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම (බැර) (රු.) | 2,000,000 | 2,000,000 | 2,000,000 |
| ජංගම ගිණුම (හර) (රු.) | 50,000 | 25,000 | 30,000 |

(2) විශ්‍රාම ගන්නා දිනට වත්කම් ප්‍රත්‍යාගණනය කරන ලද අතර ප්‍රත්‍යාගණිත අගයන් පහත සඳහන් පරිදි විය:

| | |
|---|---|
| ඉඩම | රු.2,950,000/- |
| ගොඩනැගිලි | රු.1,700,000/- |
| මෝටර් වාහනය | රු.1,250,000/- |

(3) 2015 මාර්තු 31 දිනට කීර්තිනාමය රු.600,000/- ක් ලෙස ඇගයීම් කරන ලදි. කීර්තිනාමය **ඉන්දික** සඳහා ගෙවිය යුතු ප්‍රමාණය ගණනය කිරීම සඳහා පමණක් සලකා බැලීමට ද ගිණුම් පොත්වල පෙන්නුම් නොකිරීමට ද හවුල්කරුවෝ තීරණය කළහ.

(4) **ඉන්දිකගේ** විශ්‍රාම ගැනීමෙන් පසු ලාභා'ලාභ බෙදාගැනීමේ අනුපාතය **විරාජ්** සහ **රංග** අතර, පිළිවෙලින් 3:2 ලෙස වෙනස් කිරීමට ද තීරණය කරන ලදි.

(5) හවුල් ව්‍යාපාර ගිවිසුමේ සඳහන් පරිදි විශ්‍රාම ගන්නා හවුල්කරුගේ ප්‍රාග්ධන කොටස මත පොළී නොගෙවනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ,**

2015 මාර්තු 31 දිනට, තීරු ක්‍රමයට, හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම් **පිළියෙල කරන්න**. (ලකුණු 05)

## 06 වන ප්‍රශ්නය

**ඉම්රාස්, බුද්ධික** සහ **මහී** හවුල් ව්‍යාපාරයක යෙදී සිටිති. හවුල් ව්‍යාපාර ගිවිසුමේ පහත සඳහන් විධිවිධාන සලසා තිබේ:

(1) ලාභා'ලාභ බෙදාගැනීමේ අනුපාතය, **ඉම්රාස්, බුද්ධික** සහ **මහී** අතර පිළිවෙලින්, 2 : 2 : 1 වේ.

(2) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනය මත පොළී ගෙවීමක් සිදු නොකෙරේ.

(3) හවුල්කරුවන්ගේ ගැනිලි සඳහා වර්ෂයකට 5% බැගින් පොළී අයකරනු ලැබේ.

(4) **බුද්ධික** සහ **මහී** එක් අයෙකුට මසකට රු.2,000/- බැගින් වූ මාසික වැටුපකට හිමිකම් ලබයි.

හවුල් ව්‍යාපාරයේ පොත් වලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදි:

| | **හර (රු.'000)** | **බැර (රු.'000)** |
|---|---|---|
| 2014 අප්‍රේල් 01 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්: | | |
| **ඉම්රාස්** | | 2,000 |
| **බුද්ධික** | | 2,000 |
| **මහී** | | 1,000 |
| 2014 අප්‍රේල් 01 දිනට හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්: | | |
| **ඉම්රාස්** | 50 | |
| **බුද්ධික** | 25 | |
| **මහී** | | 10 |
| හවුල්කරුවන්ගේ ගැනිලි: **ඉම්රාස්** (2014 ජූනි 01 දින) | 48 | |
| **බුද්ධික** (2014 මැයි 01 දින) | 24 | |
| **මහී** (2014 දෙසැම්බර් 15 දින) | 60 | |

2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය රු.695,000/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ,**

හවුල් ව්‍යාපාරයේ 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභා'ලාභ විසර්ජන ගිණුම **පිළියෙල කරන්න**.

(ලකුණු 05)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

### 07 වන ප්‍රශ්නය

**රනිල්, අනුර** සහ **නාමල්** ලාභා'ලාභ පිළිවෙළින් 3 : 1 : 2 අනුපාතයට බෙදා ගනිමින් **රන්මල් ට්‍රේඩර්ස්** නම් වූ හවුල් ව්‍යාපාරයේ නිරතව සිටී.

හවුල් ව්‍යාපාර ගිවිසුමේ පහත සඳහන් විධිවිධාන සලසා තිබේ:

- **අනුර, රන්මල් ට්‍රේඩර්ස්** හි කළමනාකරු ලෙස ක්‍රියා කරන අතර, ඔහුට වාර්ෂිකව රු.50,000/- බැගින් වූ වැටුපක් ගෙවනු ලබයි.
- ප්‍රාග්ධන ගිණුම්වල වර්ෂය අවසානයේ පවතින ශේෂ මත 5% ක වාර්ෂික පොලියක් ගෙවිය යුතුව ඇත.

2015 මාර්තු 31 දිනට **රන්මල් ට්‍රේඩර්ස්** හි ශේෂ පිරික්සුම පහත පරිදි විය:

**2015 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම**

| | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැයට: | | |
| ඉඩම | 1,300 | |
| ගොඩනැගිලි | 900 | |
| කාර්යාල උපකරණ | 300 | |
| 2014 අප්‍රේල් 01 දිනට, සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිලි | | 45 |
| කාර්යාල උපකරණ | | 120 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 274 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 304 | |
| 2014 අප්‍රේල් 01 දිනට, තොගය | 67 | |
| බැංකු ශේෂය | 30 | |
| මිලදී ගැනුම් / විකුණුම් | 367 | 580 |
| විකුණුම් ආපසු එවුම් | 15 | |
| පරිපාලන වියදම් | 115 | |
| බෙදාහැරීමේ වියදම් | 45 | |
| මූල්‍ය වියදම් | 11 | |
| 2014 අප්‍රේල් 01 දිනට, හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්: | | |
| **රනිල්** | | 1,200 |
| **අනුර** | | 400 |
| **නාමල්** | | 800 |
| 2014 අප්‍රේල් 01 දිනට, හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්: | | |
| **රනිල්** | | 45 |
| **අනුර** | | 35 |
| **නාමල්** | 45 | |
| **එකතුව** | **3,499** | **3,499** |

පහත දැක්වෙන අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) රු.4,000/- ක ප්‍රමාණයක් බොල්ණය ලෙස ලියාහැරීමට ද ඉතිරි ණයගැතියන්ගේ ශේෂයෙන් 1% ක් අඩමාණ ණය ප්‍රතිපාදනයක් වශයෙන් සැලසීමට ද තීරණය කරන ලදී.

(2) දේපළ, පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමය යටතේ පිරිවැය මත පහත පරිදි ක්ෂය කළ යුතුය:

ගොඩනැගිලි : වාර්ෂිකව 2.5% බැගින්

කාර්යාල උපකරණ : වාර්ෂිකව 20% බැගින්.

(3) 2015 මාර්තු 31 දිනට, තොගය, පිරිවැය මත රු.119,500/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ,**

2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **රන්මල් ට්‍රේඩර්ස්** හි පහත දෑ **පිළියෙල කරන්න**:

(a) ආදායම් ප්‍රකාශය.

(b) ලාභා'ලාභ විසර්ජන ගිණුම. (ලකුණු 10)

## 08 වන ප්‍රශ්නය

තනි පුද්ගල (කේවලස්වාමි) ව්‍යාපාරයක් වන **නොදරන් ට්‍රේඩර්ස්** ව්‍යාපාරයේ පොත් වලින්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශන පිළියෙල කිරීමෙන් පසු, පහත දැක්වෙන සාරාංශගත ශේෂ පිරික්සුම් උපුටා ගන්නා ලදී:

**ශේෂ පිරික්සුම**

| | 2015 මාර්තු 31 දිනට (රු.) | 2014 මාර්තු 31 දිනට (රු.) |
|---|---|---|
| කාර්යාල උපකරණ - පිරිවැයට | 550,000 | 550,000 |
| මෝටර් වාහන - පිරිවැයට | 4,900,000 | 4,900,000 |
| කාර්යාල උපකරණ - සමුච්චිත ක්ෂය | (275,000) | (137,500) |
| මෝටර් වාහන - සමුච්චිත ක්ෂය | (2,450,000) | (980,000) |
| තොග පිරිවැයට | 165,000 | 105,000 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 860,000 | 420,000 |
| මුදල් සහ බැංකු | 320,000 | 125,000 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | (695,000) | (720,000) |
| උපචිත දෑ | (13,000) | (65,000) |
| කලින් ගෙවීම් | 12,000 | 11,500 |
| ප්‍රාග්ධනය | (4,209,000) | (2,600,000) |
| අයිතිකරුගේ ගැනිලි | 860,000 | 174,000 |
| වර්ෂය සඳහා ලාභය | (25,000) | (1,783,000) |
| | - | - |

පහත දැක්වෙන අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) රු.2,000,000/- කට මිලදී ගත්, පිරිවැය මත වර්ෂයකට 25% ක අනුපාතිකයක් යටතේ වර්ෂ 2 ක් සඳහා ක්ෂය කරන ලද එක් මෝටර් රථයක් 2015 මාර්තු 31 දින රු.1,300,000/- කට ණයට විකුණා දමන ලදී. එසේවුවත්, පොත් තබන්නාට මෙම ගනුදෙනුව පොත්වල සටහන් කිරීමට අමතක වී ගොස් තිබුණි.

(2) 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීමෙන් පසු, 2015 මාර්තු 31 දිනට තොගයේ ඇතුලත් අයිතමයක පිරිවැය රු.10,000/- ක් වුව ද, එදිනට එහි ශුද්ධ උපලබ්ධි අගය (Net Realizable Value - NRV) රු.3,500/- ක් පමණක් වූ බව සොයා ගන්නා ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ,**

2015 මාර්තු 31 දිනට **තොදරන් ට්‍රේඩර්ස්** ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **පිළියෙල කරන්න**. (ලකුණු 10)

## 09 වන ප්‍රශ්නය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **රෝයල් ටෙනිස් ක්ලබ්** හි ලැබීම් සහ ගෙවීම් ගිණුම පහත සඳහන් පරිදි විය:

**ලැබීම් සහ ගෙවීම් ගිණුම** *(රු.'000)*

| | | | |
|---|---|---|---|
| 2015.01.01 දිනට ශේෂය ඉ/ගෙ | 2,300 | පවිත්‍රකරුගේ වේතන | 430 |
| පරිත්‍යාග | 3,400 | ගොඩනැගිලි නඩත්තු | 200 |
| ක්‍රීඩා තරඟ ගාස්තු | 1,880 | ටෙනිස් පාරිභෝගික ද්‍රව්‍ය වෙනුවෙන් ගෙවිය යුතු දෑ | 930 |
| දායක මුදල් | 2,360 | බැංකු තැන්පත් ගිණුමක ආයෝජනය කළා | 2,400 |
| | | ක්‍රීඩා භූමි නඩත්තුකරුගේ වේතන | 950 |
| | | ක්‍රීඩා තරඟ වියදම් | 2,150 |
| | | 2015.12.31 දිනට ශේෂය ප/ගෙ | 2,880 |
| | **9,940** | | **9,940** |

**රෝයල් ටෙනිස් ක්ලබ්** ක්‍රීඩා සමාජයේ 2015 ජනවාරි 01 දිනට සහ 2015 දෙසැම්බර් 31 දිනට තිබූ අනෙකුත් වත්කම් හා වගකීම් පහත සඳහන් පරිදි විය:

| | **2015 ජනවාරි 01 (රු.'000)** | **2015 දෙසැම්බර් 31 (රු.'000)** |
|---|---|---|
| **වත්කම්:** | | |
| ඉඩම් | 4,000 | 4,000 |
| ගොඩනැගිලි | 6,500 | 6,000 |
| ටෙනිස් උපකරණ | 4,400 | ? |
| හිඟ දායක මුදල් | 0 | 280 |
| ටෙනිස් පාරිභෝගික ද්‍රව්‍ය තොග | 950 | 835 |
| කලින් ගෙවූ ක්‍රීඩා තරඟ වියදම් | 100 | 130 |
| **වගකීම්:** | | |
| ටෙනිස් පාරිභෝගික ද්‍රව්‍ය වෙනුවෙන් ගෙවිය යුතු දෑ | (2,270) | (1,960) |
| කලින් ලැබුණ දායක මුදල් | (480) | (350) |

පහත දැක්වෙන අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) පරිත්‍යාග, මුළුමනින්ම කාලච්ඡේදය සඳහා ආදායමක් ලෙස හඳුනාගත යුතුය.

(2) වර්ෂය තුළ ගොඩනැගිලි වලට කිසිදු එකතු කිරීමක් හෝ ඉවත් කිරීමක් සිදුකර නොමැත.

(3) 2015 ජනවාරි 01 දිනට, ටෙනිස් උපකරණ වල ඉතිරිව ඇති ප්‍රයෝජනවත් ආයුකාලය වර්ෂ 10 ක් වන අතර, 10 වන වර්ෂය අවසානයේ එම උපකරණ වල කිසිදු අවශේෂ වටිනාකමක් නැතැයි උපකල්පනය කෙරේ.

**ඔබ විසින් කළ යුතු දෑ,**

**රෝයල් ටෙනිස් ක්ලබ්** සඳහා පහත දෑ **පිළියෙල කරන්න**:

(a) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ගිණුම.

(b) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 10)

*C කොටසෙහි අවසානය*

## <u>D කොටස</u>

අනිවාර්යය ප්‍රශ්නයකි.

(ලකුණු 25)

### 10 වන ප්‍රශ්නය

**සීමාසහිත රුමේෂ් (පෞද්ගලික) සමාගමේ** 2015 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහතින් දී ඇත:

| | **හර (රු.'000)** | **බැර (රු.'000)** |
|---|---|---|
| ආදායම | | 436,000 |
| විකුණුම් පිරිවැය | 290,930 | |
| බෙදාහැරීමේ වියදම් | 33,500 | |
| පරිපාලන වියදම් | 51,650 | |
| ගෙවන ලද ලාභාංශ | 2,200 | |
| බැංකු අයිරාව මත පොලී | 100 | |
| දේපළ, පිරියත හා උපකරණ - පිරිවැයට: | | |
| ඉඩම | 30,000 | |
| ගොඩනැගිල්ල | 70,000 | |
| කාර්යාල උපකරණ | 55,500 | |
| 2014 අප්‍රේල් 01 දිනට, සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිල්ල | | 25,000 |
| කාර්යාල උපකරණ | | 23,500 |
| අතැ'ති මුදල් | 1,000 | |
| 2015 මාර්තු 31 දිනට, තොගය | 60,000 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ / වෙළෙඳ ගෙවිය යුතු දෑ | 63,000 | 62,200 |
| 2014 අප්‍රේල් 01 දිනට, ලැබිය යුතු දෑ සඳහා දීමනාව | | 1,600 |
| 2014 අප්‍රේල් 01 දිනට, උපචිත වියදම් | | 330 |
| බැංකු අයිරාව | | 5,000 |
| සාමාන්‍ය කොටස් (2014 අප්‍රේල් 01 දිනට, සාමාන්‍ය කොටස් 500,000) | | 50,000 |
| 2014 අප්‍රේල් 01 දිනට, රඳවාගත් ඉපැයීම් | | 45,750 |
| 2014 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට ආදායම් බදු ප්‍රතිපාදනය | | 8,500 |
| **එකතුව** | **657,880** | **657,880** |

පහත දැක්වෙන අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) සමාගමට රු.1,500,000/- ගෙවීමට තිබූ ගනුදෙනුකරුවෙක් 2015 ජූලි 01 දින මියගිය අතර, ඔහුගෙන් ලැබිය යුතු ප්‍රමාණය අයකර ගත නොහැකි තත්ත්වයට පත්විය. වර්ෂය අවසාන වෙළෙඳ ලැබිය යුතු ඇ ශේෂයෙන් 5% ක් ලැබිය යුතු ඇ වෙනුවෙන් දීමනාවක් ලෙස පවත්වා ගැනීමට තීරණය කරන ලදී.

(2) දේපළ, පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමය යටතේ පිරිවැය මත ක්ෂය කළ යුතු විය. වත්කම් වල ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි වෙතැයි ඇස්තමේන්තු කර තිබේ:

ගොඩනැගිලි : වර්ෂ 20

කාර්යාල උපකරණ : වර්ෂ 5

(3) 2014 අප්‍රේල් 01 දිනට උපචිත වියදම්වල සංයුතිය පහත පරිදි විය:

| | රු. |
|---|---|
| රක්ෂණ වාරික | 130,000 |
| උපකරණ නඩත්තු වියදම් | 200,000 |

2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රක්ෂණ වාරික ලෙස රු.260,000/- ක් ද, උපකරණ නඩත්තු වියදම් සඳහා රු.350,000/- ක් ද සමාගම ගෙවන ලද අතර එකී වියදම් දෙකම පරිපාලන වියදම් යටතේ ඇතුලත් කර ඇත.

2015 මාර්තු 31 දිනට රක්ෂණ වාරික ලෙස රු.35,000/- ක් ගෙවිය යුතුව ඇති අතර, උපකරණ නඩත්තුව සඳහා රු.20,000/- ක කලින් ගෙවීමක් සිදුකර ඇත.

(4) පෙර තක්සේරු වර්ෂය (එනම් 2013/14), සඳහා වූ ආදායම් බදු වගකීම රු.8,250,000/- ක් ලෙස අවසන් නිගමනයකට එළඹී අතර එය ප්‍රවර්තන තක්සේරු වර්ෂයේදී සම්පූර්ණයෙන් ගෙවන ලදී. එසේවුවත්, පොත් තබන්නා විසින් එකී ගෙවීම පරිපාලන වියදම් යටතේ ඇතුලත් කරන ලදී.

2014/15 තක්සේරු වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම රු.9,300,000/- ක් වෙතැයි ඇස්තමේන්තු කර ඇත.

(5) 2014 අප්‍රේල් 01 දිනට පැවති සෑම කොටස් 5 කටම අළුත් කොටස් 2 ක් වන සේ එක් කොටසක් රු.100/- බැගින් වූ හිමිකම් නිකුතුවක් සමාගම 2014 අගෝස්තු 01 දින සිදුකරන ලදී. හිමිකම් නිකුතුවට කොටස්හිමියන් සම්පූර්ණයෙන් දායකත්වය ලබා දී තිබූ අතර ලද මුදල්, වෙළෙඳ ගෙවිය යුතු ඇ ගිණුමට බැර කරන ලදී.

**ඔබ විසින් කළ යුතු ඇ,**

**සීමාසහිත රුමේෂ් (පෞද්ගලික) සමාගමේ,** කළමනාකරණයේ භාවිතය සඳහා පහත ඇ **පිළියෙල කරන්න**:

(a) 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 13)

(b) 2015 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 12)

(මුළු ලකුණු 25)

*D කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |